Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල


ශ්‍රේණිය : 6 | විෂය : ගණිතය | සතිය : 9

**පාඩම :- භාග**


**කාලච්ඡේද ගණන :- 09**


- පෙළපොතේ 110, 111, 112 පිටු හොඳින් අධ්‍යයනය කරන්න.


පහත දැක්වෙන එක් එක් රූපයේ අඳුරු කර ඇති කොටස මුළු රූපයෙන් භාගයක් ලෙස දක්වා එය කියවන ආකාරය ලියන්න.

උදා:- =  $\frac{1}{3}$ ( තුනෙන් එක)

 = .............................. (.......................................)

 = .............................. (.......................................)

 = .............................. (.......................................)

 = .............................. (.......................................)

**එකට වඩා අඩු බින්දුවට වඩා විශාල භාග සංඛ්‍යා තත්‍ය භාග හෙවත් නියම භාග නම් වේ.**

පහත දැක්වෙන සංඛ්‍යා අතරින් තත්‍ය භාග වෙන් කොට ලියන්න.

$$\frac{2}{3}, \quad \frac{4}{4}, \quad \frac{8}{5}, \quad \frac{1}{4}, \quad \frac{1}{3}, \quad \frac{5}{7}, \quad \frac{7}{4}, \quad \frac{2}{7}, \quad 1\frac{2}{3}$$

- 113 පිටුවේ 9.1 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න
- 114 පිටුවේ "භාගයක හරය හා ලවය හඳුනා ගැනීම" නිවැරදිව අධ්‍යයනය කරන්න.

**තත්‍ය භාගයක ලවය 1 වූ භාග ඒකක භාග නම් වේ.**

උදා:- $\frac{1}{3}, \frac{1}{7}, \frac{1}{8}, \frac{1}{100}, \ldots\ldots\ldots$

- පෙළපොතේ 9.2 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න

පෙළපොතේ 116 පිටුව අධ්‍යයනය කරන්න. එමඟින් තුල්‍ය භාග නිවැරදිව විස්තර කරන්න.

**භාග සංඛ්‍යාවක හරයත් ලවයත් එකම පූර්ණ සංඛ්‍යාවකින් (බින්දුව හැර) ගුණ කිරීමෙන් ලැබෙන භාග සංඛ්‍යාව මුල් භාග සංඛ්‍යාවට තුල්‍ය භාගයක් වේ.**

තුල්‍ය භාග තෝරා යා කරන්න.

| | |
|---|---|
| $\frac{2}{3}$ | $\frac{15}{21}$ |
| $\frac{5}{7}$ | $\frac{4}{6}$ |
| $\frac{3}{4}$ | $\frac{16}{20}$ |
| $\frac{4}{5}$ | $\frac{6}{21}$ |
| $\frac{2}{7}$ | $\frac{9}{12}$ |

**භාග සංඛ්‍යාවක හරයත් ලවයත් ඉතිරි නැතිව බෙදෙන එකම පූර්ණ සංඛ්‍යාවකින් බෙදීමෙන් ලැබෙන භාග සංඛ්‍යාව මුල් භාග සංඛ්‍යාවට තුල්‍ය භාගයක් වේ.**

තුල්‍ය භාග ලැබෙන සේ හිස් කොටු සඳහා සුදුසු අගය යොදා සම්පූර්ණ කරන්න.


$\frac{7}{14} = \frac{\quad}{2}$ $\qquad$ $\frac{15}{24} = \frac{5}{\quad}$ $\qquad$ $\frac{3}{6} = \frac{\quad}{\quad}$


$\frac{12}{18} = \frac{2}{\quad}$ $\qquad$ $\frac{20}{30} = \frac{2}{\quad}$

පෙළපොතේ 118,119 පිටුවල දැක්වෙන 9.3 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.

පෙළපොතේ 119 පිටුව නිවැරදිව අධ්‍යයනය කරන්න.

රූපයේ අඳුරුකර ඇති ප්‍රදේශ අනුව භාග යුගලය = , <, > යොදා සම්බන්ධ කරන්න.

 $= \frac{1}{4}$

 $= \frac{1}{8}$ $\qquad \frac{1}{4} > \frac{1}{8}$

**ඒකක භාග දෙකකින්, කුඩා හරය ඇති භාගය අනෙක් භාගයට වඩා විශාල වේ.**

- පෙළපොතේ 120 පිටුව හොඳින් අධ්‍යයනය කරන්න.

ලවය සමාන භාග දෙකක් සංසන්දනය කිරීම නිවැරදිව සම්පූර්ණ කරන්න.

$\frac{2}{3} \longrightarrow \frac{1}{3}$ ඒවා 2 යි.

$\frac{2}{7} \longrightarrow \frac{1}{7}$ ඒවා 2 යි.

$\frac{1}{3} > \frac{1}{7}$ බැවින් $\frac{2}{3} > \frac{2}{7}$ වේ.

**ලවය සමාන භාග දෙකකින්, කුඩා හරය ඇති භාගය අනෙක් භාගයට වඩා විශාල වේ.**

පහත දී ඇති භාග = , <, > යොදා සම්බන්ධ කරන්න.

උදා:- $\frac{5}{7} > \frac{5}{8}$

1) $\frac{3}{4}$ ........... $\frac{3}{5}$

2) $\frac{7}{9}$ ............ $\frac{7}{8}$

3) $\frac{4}{7}$ ............. $\frac{4}{6}$

4) $\frac{5}{6}$ ............ $\frac{5}{8}$

5) $\frac{3}{11}$ ............ $\frac{3}{7}$

**හරය සමාන භාග දෙකකින්, විශාල ලවය ඇති භාගය අනෙක් භාගයට වඩා විශාල වේ.**

පහත දැක්වෙන භාග > හෝ < යොදා ආරෝහණ පිලිවෙලට සකසන්න.

උදා:- $\frac{1}{7}, \frac{4}{7}, \frac{3}{7}, \frac{5}{7}$

$\frac{1}{7} < \frac{3}{7} < \frac{4}{7} < \frac{5}{7}$

1) $\frac{5}{8}, \frac{5}{7}, \frac{5}{9}$ 2) $\frac{7}{12}, \frac{7}{9}, \frac{7}{8}, \frac{7}{10}$ 3) $\frac{2}{13}, \frac{8}{13}, \frac{5}{13}, \frac{3}{13}$ 4) $\frac{1}{5}, \frac{4}{5}, \frac{2}{5}, \frac{3}{5}$

පෙළපොතේ 121 පිටුව නිවැරදිව අධ්‍යයනය කරන්න.

උදා:- $\frac{1}{7} \ldots\ldots \frac{5}{14}$

$\frac{1\times2}{7\times2} \ldots\ldots \frac{5}{14}$

$\frac{2}{14} < \frac{5}{14}$

$\frac{1}{7} < \frac{5}{14}$

- පෙලපොතේ 122 පිටුවේ නිදසුන 1 නිවැරදිව අධ්‍යයනය කරන්න.
- පෙලපොතේ 122 පිටුවේ 9.4 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.

උදා :- $\frac{3}{12} + \frac{4}{12}$

$\frac{3+4}{12}$

$\frac{7}{12}$

- පෙලපොතේ 123 පිටුව බලන්න. හරය සමාන භාග යුගලයක් හා හරය අසමාන භාග යුගලයක් එකතු කරන ආකාරය හා අඩු කරන ආකාරය නිවැරදිව අධ්‍යයනය කරන්න.

$\frac{2}{8} + \frac{3}{8}$

$\frac{2+3}{8}$

$\frac{5}{8}$

$\frac{11}{13} - \frac{5}{13}$

$\frac{11-5}{13}$

$\frac{6}{13}$

$\frac{5}{12} + \frac{2}{3}$

$\frac{5}{12} + \frac{2\times4}{3\times4}$

$\frac{5}{12} + \frac{8}{12}$

$\frac{5+8}{12}$

$\frac{13}{12}$

- පෙළපොතේ 125, 126 පිටුවල 9.5 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.
- පෙළපොතේ 127, 128 පිටු නිවැරදිව අධ්‍යයනය කර 9.6 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.
- පෙළපොතේ 129, 130 පිටු නිවැරදිව අධ්‍යයනය කරන්න.
- මිශ්‍ර අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.
- ඔබට මතු වන ගැටළු ගුරුතුමා හෝ ගුරුතුමිය මඟින් නිවැරදි කර ගන්න.